**තුම්පනේ ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සිට 2021 දක්වා කාල පරිච්ඡේදය තුළ නිරවුල් කරන ලද එකතුව රු.3,349,272 ක කර්මාන්ත ණයගැති ශේෂ 16 ක් තවදුරටත් ණයගැතියන් තුළ දක්වා තිබුණි. | කඩිනමින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2019 සිට 2021 කාල පරිච්ඡේදය තුළ ගෙවා අවසන් කළ එකතුව රු.5,806,869 ක ණයහිමි ශේෂ 21 ක් තවදුරටත් ණයහිමියන් තුළ ඇතුළත් වී තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව සමඟ සැසඳීමේදී රු.569,076 ක වෙනසක් විය. | වෙනස්කම් පරීක්ෂාකර නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සුසාන භූමි හා මිනීපිටි ආඥා පනතේ 03 වන වගන්තිය | සභාව විසින් භාවිතයට ගනු ලබන සුසාන භූමි 37 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 (3) | 2015 සිට 2019 දක්වා කාලයට අදාල කාලය ඉකුත් වූ රු.1,538,206 ක තැන්පත් 69 ක් නියාදනය කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත | | | |
| | ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | ස්ථාන 05 ක ප්‍රදර්ශනය කර තිබුණු රු.64,250 දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර නිකුත්කර නොතිබුණි. | හිඟ අය කිරීමට කටයුතු කරන බව. | බලපත්‍ර නිකුත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,743,785 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,820,903 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,744,000 | 3,248,188 | 3,239,550 | 1,765,855 | 2,744,000 | 3,143,434 | 3,514,884 | 1,757,217 |
| (ii) | කුලී | 5,156,000 | 4,780,730 | 5,261,153 | 408,847 | 6,312,000 | 5,376,152 | 4,899,074 | 889,270 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,640,000 | 1,683,076 | 1,493,955 | 189,121 | 1,640,000 | 1,700,842 | 1,447,842 | - |
| (iv) | වෙනත් ආදායම් | 30,953,600 | 46,016,081 | 50,851,993 | 34,449,247 | 22,240,500 | 59,241,040 | 51,735,809 | 39,285,159 |
| | | 40,493,600 | 55,728,075 | 60,846,651 | 36,813,070 | 32,936,500 | 64,461,468 | 61,597,609 | 41,931,646 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,765,855 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 16 කින් එකතුව රු.279,019 ක් ද රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 68 කින් එකතුව රු.633,426 ක් විය. | හිඟ ආදායම් රැස් කිරීමට සැලසුම් කර ඇති බව. | පනතේ විධිවිධාන හා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.872,652 ක් හා මුද්දර ගාස්තු රු.30,014,580 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ජල ව්‍යාපෘතීන් 02 ක් ඉටු කිරීම සඳහා රු.3,890,024 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ අවසන් නොකිරීම හේතුවෙන් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | අරමුදල් ප්‍රමාණවත් නොවූ බව. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ රු.1,686,061 ක් වැයකර ඉදිකරන ලද අලකොලමඩිත්ත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී ජල පාරිභෝගිකයින් හට ජල සම්බන්ධතා ලබා දීමට කටයුතු කරන බව. | අදාළ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවට අයත් ජල ව්‍යාපෘති 03 ක 2022 වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය 36ක් හා කොලිෆෝම් (Coliform) බැක්ටීරියාව 28 – 110 අතර පරාසයක පැවතුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව කටයුතු නොකර බීමට නුසුදුසු ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | ජල සාම්පල් පරීක්ෂා කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන බව. | ජල සාම්පල් පරීක්ෂා කර පිරිසිදු පානීය ජලය බෙදාහැරිය යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුජාතා බාලිකා විදුහල ඉදිරිපිට වෙළඳ සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා 2014 වර්ෂයේ දී ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා දී තිබුණ ද අදාළ කොන්ත්‍රාත්කරු කර්මාන්තය අතහැර දමා තිබූ අතර එම කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණු අත්තිකාරම් රු.883,333 ක් මේ දක්වා පියවා ගෙන නොතිබුණි. | මු.රෙ.104 (3) පරිදි පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගන්නා බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 08 දින අස්ථානගත වී තිබුණු රු.74,250 ක ක්‍රීඩා උපකරණ තොගය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) (4) පරිදි පරීක්ෂාවන් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.78,290,549 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.5,840,917 ක් හා වසර 5 ට වැඩි ශේෂය රු.3,647,359 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විවිධ ණයහිමි ශේෂ 105 ක එකතුව රු.12,009,300 ක් වූ අතර ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.9,264,729 ක් ද, රු.62,155,624 ක් විය. | පරීක්ෂා කර බලා නිරවුල් කරන බව. | ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,358,214 ක වාහන 03 ක් හා යන්ත්‍ර 02 ක් වසර 05 ත් 09 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා සිදු කිරීම හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ඉදිකල හතරලියද්ද වෙළඳපොල සංකීර්ණය පිහිටි ඉඩම පවරා ගෙන නොතිබුණි. | නීත්‍යානුකූලව අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | ගලගෙදර උප කාර්යාලය පිහිටි ඉඩම, අරම්බේකඩේ උප කාර්යාලයට අයත් ඉඩම් කොටස් 06 ක්, සංඝරාජපුර උප කාර්යාලයට අයත් ඉඩම් කොටස් 08 ක් හා ගොඩනැගිලි 08 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් විමසා ඇති බව. | ඉඩම්වල අයිතිය පවරාගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය**<br>2018 – 2021 කාලපරිච්ඡේදයට අදාළව ස්ථාන මාරුවී ගොස් තිබුණු නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව රු.758,450 ක ණය ශේෂයක් ද අයකර ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | ණය අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 21 ක සියයට 30 සිට සියයට සියයට ඉක්මවා ද, වියදම් විෂයයන් 09 ක සියයට 37 සිට සියයට 99 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | අරමුණු හා සැලසුම් ඵලෙසින් සිදු කිරීමට අපේක්ෂා කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල යුතුය. |

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගන්නා බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |